# ධර්ම විශ්ලේෂණයේදි උපමා භාවිතය: මජ්ඣිම නිකායේ ශ්‍රාවක භාෂිත දේශනා ඇසුරින් කෙරෙන අධ්‍යයනයක්

ආචාර්ය පනාමුරේ චන්දිම හිමි

## ප්‍රවේශය

ත්‍රිපිටකාගත ශ්‍රාවක භාෂිත දේශනාවන් තුළ ධර්ම විශ්ලේෂණය සඳහා උපමා හා රූපක භාවිත වී ඇත. ලෞකික සාහිත්‍යයේ දී රස උත්පාදනය පිණිස උපමා රූපක භාවිත වුවත් සම්බුද්ධ ශ්‍රාවකයන් ඒවා භාවිත කර ඇත්තේ අර්ථය පැහැදිලි කිරිම පිණිස ය. ඊට හේතුව වී ඇත්තේ ධර්මය සන්නිවේදනයේ දී යම් ගැඹුරු කරුණු පැහැදිලි කිරීමට ඒවායින් මහඟු පිටුබලයක් ලැබීමයි. ඒ බව පහත උද්ධෘතවලින් ප්‍රකාශ වේ. ''උපමායපිධෙකච්චේ විඤ්ඤුපුරිසා භාසිතස්ස අත්‍ථං ආජානන්ති''[1] ''උපමා ඛො මෙ අයං සුනක්ඛත්ත කතා අත්‍ථස්ස විඤ්ඤාපනාය අයමෙවත්‍ථ අත්ථො''[2] ඒ අනුව නුවණැත්තා උපමාවෙන් අර්ථය දැනගන්නා සේම කරුණු විග්‍රහ කර දක්වීමට ද උපමාව යොදා ගැනෙයි.

මජ්ඣිමනිකායේ ඇතුළත් සූත්‍ර ප්‍රමාණය 152 පමණ වේ. ඒවා අතරින් ශ්‍රාවක භාෂිත ලෙස සූත්‍ර 29ක් දැකිය හැකි අතර විවිධ විද්වතුන් අතර ඒ සම්බන්ධ මතවාද දැකිය හැකිය. සම්බුද්ධ ශාසනයේ ප්‍රමුඛ තෙරවරුන්ගේ දේශනා ඒ අතර වෙයි. උන් වහන්සේලා අර්ථ විග්‍රහය සඳහා යොදාගත් උපමා රැසකි. උපමාව ප්‍රකාශවන පදවලින් ඒ බව මැනවින් අවබෝධ කරගත හැකිය.

## අන්තර්ගතය

මජ්ඣිමනිකායේ ශ්‍රාවක භාෂිත දේශනාවන්හි යොදාගෙන ඇති උපමා සමග ඊට ගැළපෙන උපමාවාචී පද ද භාවිත කර ඇත. මෙම ලිපියෙන් සිදු කෙරෙන්නේ ඒ පිළිබඳව කෙරෙන විමර්ශනයකි. ඒ අනුව,



''සෙය්‍යථාපි, එවමෙව ඛො, යථාරූපො, තථාරූපො, එවරූපා, යථා, සන්නිභං, ඉව,

මෙවැනි උපමාවාචී පද පාදක කරගත් සිත්ගන්නාසුලු උපමා රාශියක් මජ්ඣිමනිකායෙහි ශ්‍රාවක භාෂිත දේශනා තුළ විද්‍යමාන ය. මෙසේ පෙළ ගැසී ඇති උපමා අධ්‍යයනයේ පහසුව පිණිස ප්‍රස්තුත කිහිපයකට ගොනු කරනු ලැබේ. එය මෙසේ දැක්විය හැකිය.

| උපමා වර්ගය | පාලි | සිංහල |
|---|---|---|
| සුවිශේෂී පුද්ගල චරිත අන්තර්ගත උපමා | ''සෙය්‍යථාපි ආවුසො කංසපාති ආභතා ආපණාවා කම්මාකුලාවා පරිසුද්ධා පරියොදාතා තමෙතං සාමිකා පරිභුඤ්ජෙය්‍යුඤ්චෙව පරියොයෙය්‍යුඤ්ච තං රාජපථෙ නික්ඛියෙය්‍යුං''[3] | ධූලියෙන් හා මළකඩින් බැඳීගිය කස්ලෝ තලියක් කඩෙන් ගෙනවුත් ප්‍රයෝජනයට නොගෙන පිරිසිදු නොකොට ධූලියෙහි ම තබන්නාක් මෙන්. |
| | ''සෙය්‍යථාපි ආවුසො කංසපාති ආභතා ආපණා වා කම්මාරකුලා වා පරිසුද්ධා පරියොදාතා තමෙතං සාමිකා අහිකුනපං වා කුක්කුර කුණපං වා මනුස්සකුනපං වා රචයිත්වා අඤ්ඤිස්සා කංසපාතියා පටිකුජ්ජිත්වා අන්තරාපනං පටිපජ්ජෙය්‍යුං''[4] | කස්ලෝ තලියක් තුළ සර්ප කුණක් හෝ බලු කුණක් හෝ මිනිස් කුණක් හෝ දමා කස්ලෝ තලියෙන් ම වසාගෙන යන විට යමකු ඒ තලිය වසුන් හැර බලත් ම මහත් පිළිකුලක් හටගන්නාක් මෙන් සැනසෙන්නට කැමති තරුණයෙක් දිය නා පිරිසිදුව සිටින විට උපුල් සමන් ආදී මල්දමක් ලැබ හිස මත පළඳින්නාක් මෙන් |

| | | |
|---|---|---|
| | ''සෙය්‍යථාපි අවුසො<br>ඉත්ථියා වා පුරිසො වා<br>දහරො යුවා මණ්ඩනක<br>ජාතිකො සීසං නහාතො<br>උප්පලමාලං වා වස්සික<br>මාලං වා අත්තිමුත්තක<br>මාලං වා ලභිත්වා උභොපි<br>හත්ථෙහි පටිග්ගහිත්වා<br>උත්තමංගෙ සිරස්මිං<br>පතිට්ඨාපෙය්‍ය''[5] | තරුණ ස්ත්‍රියක් සේ<br>පුරුෂයෙක් ස්නානය කොට<br>උපුල් මල්දමක් දෑ සමන්<br>මල් දමක් යොහොඹු මල්<br>දමක් දෑතින් පිළිගෙන<br>පළඳින්නා සේ. |
| | '' සෙය්‍යථාපි අවුසො<br>ඉත්ථියා වා පුරිසො වා<br>දහරො යුවා මණ්ඩනක<br>ජාතිකො ආදාසෙන වා<br>පරිසුද්ධෙ පරියොදාතෙ<br>අච්ඡෙ වා උදකපත්තෙ<br>සකං මුඛනිමිත්තං<br>පච්චවෙක්ඛමානො''[6] | යම් සේ යොවුන් වියේ<br>සිටි ස්ත්‍රියක් හෝ<br>පුරුෂයෙක් කැඩපතකින්<br>මුහුණබලන්නේ ලප කැලැල්<br>ආදී දොස් මුහුණේ තිබෙන<br>බව දැක ඒවා දුරු කිරීමට<br>උත්සාහ කරන්නාක් මෙන් |
| | "පුරිසො<br>පිසච්ඡාදුබ්බල්‍යපරෙතො<br>මධුපිණ්ඩිකං අධිගච්ඡෙය්‍ය<br>සො යතො යතො<br>සායෙය්‍ය ලභෙථෙව සාදුං<br>රසං අසෙචනකං"[7] | බඩගින්නෙන් දුර්වලව<br>පෙළෙන පුරුෂයෙක් පැණි<br>අග්ගලාවක් ලබා එහි හැම<br>පැත්තකින් ම මිහිරි රසය ම<br>ලබන්නාක් මෙන්. |
| | "රඤ්ඤො වා රාජ<br>මහාමත්තස්ස වා<br>නානාරත්තානං දුස්සානං<br>දුස්සකරණ්ඩකො පූරෙ<br>අස්ස"[8] | රජෙකුට හෝ ඇමතියෙකුට<br>නානාවර්ණයෙන් යුත්<br>සළු පෙට්ටියක් වෙයි නම්<br>තමා කැමති වෙලාවක එය<br>පළඳින්නාක් මෙන්. |



| | | |
|---|---|---|
| | "පුරිසස්ස හත්ථපාදා ඡින්නා තස්ස<br>චරතොචෙව තිට්ඨතො ච සුත්තස්ස<br>ච ජාගරස්ස ච සත්තං සමිතං<br>ඡින්නා ච හත්ථපාදා."[9] | යම්කිසිපුද්ගලයෙකු<br>අත් පා කපා දැමූ<br>කල්හි ඔහුට නිතර<br>ම සිහියට එන්නාක්<br>මෙන්. |
| | "චොරො යථා සන්ධිමුඛෙ ගහීතො<br>- සකම්මනා හඤ්ඤති පාප<br>ධම්මො."[10] | මං පැහැරීම් කළ<br>සොරුට දඬුවම්<br>ලැබෙන්නාක් මන්. |
| අද්‍යශ්‍යමාන<br>චරිත භාවිත<br>උපමා | "අඥ්ජනීව නවා චිත්තා පූතිකායො<br>අලංකතෙ."[11] | විසිතුරු හඳුන්<br>භාජනයක් මෙන්<br>සැරසූ ශරීරය. |
| | "බලවා පුරිසො දළ්හෙන<br>වරත්තබන්ධනෙන සීසෙ සීසවෙදනා<br>හොති."[12] | ශක්තිමත් පුරුෂයෙක්<br>දැඩි හම්පටියකින් හිස<br>තදින් වෙලන්නාක්<br>මෙන්. |
| | "අධිමත්තා සීසෙ සීස වෙදනා<br>හොති."[13] | ශක්තිමත් පුරුෂයෙක්<br>තියුණු හුලකින් හිසට<br>අනින්නාක් මෙන්." |
| | දක්ඛො ගොඝාතකො තිණ්හෙන<br>ගොවිකත්තනෙන කුච්ඡිං<br>පරිකන්තෙය්‍ය."[14] | දක්ෂ හරක්<br>මරන්නෙකු ගෙරි<br>මස් කපන තියුණු<br>ආයුධයකින් බඩ<br>කපන්නාක් මෙන්. |
| | "ද්වෙ බලවන්තො පුරිසා දුබ්බලතරං<br>පුරිසං නානාබාහාසු ගහෙත්වා<br>අංගාරකාසුයා සන්තාපෙය්‍යුං<br>සම්පාරිතාපෙය්‍යුං."[15] | ශක්තිමත් පුරුෂයන්<br>දෙදෙනෙකු දුර්වල<br>පුරුෂයෙකු අල්ලා<br>අඟුරු වලක දමා<br>තවන්නාක් මෙන්. |

25 MAY 2022
63167

| | | |
|---|---|---|
| | පුරිසො සාරත්ථිකො සාරග වෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව මූලං අතික්කම්ම ඛන්ධං සාඛාපලාසෙ සාරං පරියෙසිතබ්බං මඤ්ඤෙය්‍ය." [16] | "අරටුව සහිත ගහක් හොයන මිනිහෙක් මහ ගසක් තිබිය දී ගසේ මුලත් අත්හැර කඳත් අත්හැර අතු හා කොලවල අරටුව සොයන්නාක් මෙන්. |
| සත්ව ලෝකය සම්බන්ධ උපමා | "අන්තමසො ගද්දූහනමත්තම්පි."[17] | දෙනකගෙන් කිරි බින්දුවක් දෙවීමට ගතවන කාලයක් වැනි සුළු කාලයක්. |
| ස්වභාවික වස්තු ප්‍රස්තුත කරගත් උපමා | "ඛීරෝදකී භූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තො විහරිස්සන්තීති."[18] | කිරි හා දිය මෙන් ප්‍රියමනාපව සිටියි. |
| | "ඌනොනු ඛො චන්දො පුණ්ණො නුඛො චන්දොති."[19] | පුන් පොහෝ දිනයෙහි අද අඩ සඳ යැයි සැක නොකරන්නාක් මෙන්. |
| | "අන්තමසො හරීතකීඛණ්ඩම්පි."[20] | අරළු කැබැල්ලක් තරම්වත්. |
| | "අඨායං අචිරවති නදී උභතො කුලානි සංවිස්සන්දන්ති ගච්ඡති."[21] | මහා වැස්ස වහින විට අචිරවතී ගඟ දෙගොඩතලා ගලා බසින්නාක් මෙන්. |
| | "තෙලප්පදීපස්ස ඣායතො තෙලම්පි පරිසුද්ධං වට්ටිපි පරිසුද්ධා සො තෙලස්සපි පරිසුද්ධත්තා වට්ටියාපි පරිසුද්ධත්තා න අන්ධංන්ධං විය ඣායති."[22] | යම් පුද්ගලයන් විසින් දල්වන ලද පහනෙහි තෙල් හා පහන් වැටිය අපිරිසිදු නම් එහි එළිය ද අඳුරු ය. |
| මිනිස් චර්යා රටාවේ විවිධ අවස්ථානුකූලව ගොඩනැගුණු උපමා | "දුම්මප්ඵානී ච පතන්ති මානවා දහරො ච වුද්ධා ච සරීරභෙදා."[23] | ගස්වල ගෙඩි මෙන් ගිලිහී මරණයට පත්වෙති. |



මේ ආදී වශයෙන් දක්වා ඇති උපමා ශ්‍රාවක භාෂිතයන්හි අන්තර්ගත වී ඇති ආකාරය විමසීම වැදගත් වේ.

මෙවැනි ආකාරයේ සූත්‍ර බොහෝ ප්‍රමාණයක උපමා රූපක යොදා ගෙන ඇති ආකාරය දැකිය හැකි අතර තවත් ප්‍රසිද්ධ උපමා රාශියක් ශ්‍රාවකයන් වහන්සේලා තම දේශනා තුළදී යොදා ගෙන ඇති ආකාරය දැකිය හැකිය. මෙහිදි පැවසිය යුතු වන්නේ ඇතැම් උපමා ශ්‍රාවකයන් වහන්සේලා පමණක් භාවිත කර ඇති උපමා මෙම පර්යේෂණයෙන් සොයා ගත් ආකාරයට මෙහිදී ඉදිරිපත් කරන අතර මෙය ඕනෑම අවස්ථාවක සංවාදයට විවෘතව ඇති බවද දක්වන්නෙමු. මා අධ්‍යයනය කරන ලද කරුණු වලට අනුව මාගේ නිගමනය මෙහි දැක්වේ.

- මල්කරුවෙක් විසිතුරු මල් මාලාවක් ගොතන්නාක් මෙන්
- රන් කරුවෙක් කැමති රන් නිපැයුමක් කරන්නාක් මෙන්
- සුභ කින්නක දෙවියන් මෙන්
- තෙද බලැති යකුන් මෙන්
- නිරයෙන් උපන් සත්වයෙක් මෙන්
- කැඩූ මීවදයෙහි ඇලෙන මී මැස්සන් මෙන්
- යහපත් ආජානීය අශ්වයකු මෙන්
- සරාසඳ නැගෙන්නා සේ
- වතුරක මෙන් පොළොවෙහි ගිලෙම්
- පොළොවෙහි මෙන් දියෙහි ඇවිදීම්
- අහස මෙන්
- පොළොව මෙන්
- අපාය මෙන්
- තේජස මෙන්
- වායු මෙන්

- එලය නොසිඳ ගසෙහි හරය කපාගත නොහැක්කා සේ
- පිරිසිදු රන් තලියක රසවත් අහරක් දකින්නාක් මෙන්
- (කාමයො) කඩුවක ලොඩුවක් වැනි ය
- (කාමයො) සැතක කැඩපතකින් මුහුණ බලා සතුටු වන්නාක් මෙන්
- වැදූ මවක් වැනි

මේ ආදී වූ උපමා රාශියක් මජ්ඣිමනිකායේ ශ්‍රාවක භාෂිත දේශනා තුළ අන්තර්ගත වී ඇත. බොහෝ විට ශ්‍රාවක භාෂිත දේශනාවල පමණක් නොව විවිධ බුද්ධ භාෂිත දේශනාවල සඳහන් උපමා ශ්‍රාවකයන් වහන්සේලා ද තම දේශනා තුළ දී ඒ ආකාරයෙන් ම යොදාගෙන ඇති අයුරු පැහැදිලි ය.

බුද්ධ කාලීන භාරතයෙහි පැවති සමාජ ආර්ථික වටපිටාව ඉස්මතු වන විශේෂ අවස්ථාවන් මෙම උපමා මගින් නිරූපිත වී ඇති අයුරු අවබෝධ කරගත හැකිය. ව්‍යාපාර ක්ෂේත්‍රය ඉතා ශක්තිමත්ව පැවති කාල වකවානුවක් ලෙස එම යුගය සැලකීමට හැකි ආකරයේ උපමා රාශියක් ඉහතින් සඳහන් කරන ලදී. රන්කරු, රියකරු, ලෝහකරු, කුඹල්කරු, ගොපලු, වලන්කරු, සූදුකරු, ගවඝාතකයන් ආදී වශයෙන් ධාර්මික මෙන් ම අධාර්මික ව්‍යාපාර පොදුවේ පැවති බව පැහැදිලි ය. ලී වඩුවා පටන් අහිගුණ්ඨිකයා දක්වා චරිත වර්තමානයේ පවා ජීවත් වෙයි. තව ද 'වැදූ මව වැනි' ආදී වූ උපමාවලින් එකල සමාජයේ මාතෘත්වය කෙරෙහි පැවති ආකල්පය අවබෝධ කරගත හැකි ය.

අතීත භාරතයේ වැසියා පවා දේවත්වය ඉතා ඉහළින් සැලකූ අතර ජීවමාන බුදුරදුන් සමයෙහි ද එහි ආභාසය බලපෑ බවට ශ්‍රාවකයන් යොදාගත් උපමා සාධක ලෙස දැක්විය හැකි ය. දෙවියන්, යක්ෂ, ප්‍රේත, අමනුෂ්‍ය කොටස් පිළිබඳ යම් අවදි බවක් ශ්‍රාවක භාෂිත දේශනා තුළින් පෙනෙයි. පෘථග්ජනයාට නොපෙනෙන යකුන්, දෙවියන් ආදීන් උපමාවන්ට ඇද ගැනීමෙන් එකල සමාජය තුළ නොපෙනෙන බලවේග කෙරෙහි තිබූ අවබෝධය හා අවධානය පැහැදිලි ය. ශ්‍රාවකයන් වහන්සේලා තම දේශනාවන්හි දී එම උපමා යොදා ගැනීමෙන් එය වඩාත් තහවුරු වෙයි.



තවද විවිධාකාර මනුෂ්‍ය චරිතවල ස්වභාවය ප්‍රකට කිරීමට සත්ත්ව චරිත උපමා වශයෙන් යොදාගෙන ඇති ආකාරය ද ශ්‍රාවක භාෂිතයන්හි සුවිශේෂත්වයකි. බාහිර ස්වරූපය නොව අභ්‍යන්තරයෙහි නිරූපිත ගුණ ස්වභාවය පාදක කරගත් විවිධ සත්ත්ව චරිත උපමාවන් වශයෙන් භාවිත ශ්‍රාවක භාෂිත දේශනා බොහෝ ප්‍රමාණයක් හඳුනා ගත හැකි ය.

ස්වභාවික සුන්දරත්වය කෙරෙහි නිරන්තර අවධානයක් යොමු කරන බුදුදහම තම ශ්‍රාවකයන්ගේ ධර්මාවබෝධය සඳහා ස්වාභාවික පරිසරය මෙවලමක් කොට ගෙන ඇත. පාරිශුද්ධත්වයේ සංකේතය ලෙස නෙලුම් මල භාවිත කොට ඇත. වර්තමානයේ දී එය එසේ ම ය. එසේම සඳුන්, සමන් මල් ආදිය ද යොදා ගෙන ඇත්තේ වටිනා හර පද්ධතීන් ගෙනහැර පෑම පිණිසය.

ස්වාභාවික පාරිසරික වස්තූන් මුල්කරගෙන ධර්මය ප්‍රචලිත කිරීමට වෑයම් කිරීම තුළින් තවදුරටත් එකල ජන සමාජය ස්වභාවික පරිසරයට ළෙන්ගතු වූ බව පැහැදිලි ය. තමා ප්‍රිය කරන සුන්දර වස්තූන් සමග ගැඹුරු ධර්ම කොට්ඨාස හදවත් තුළ පැලපදියම් කිරීම පහසු හෙයින් නිරතුරුව නෙත ගැටෙන පරිසරයේ සුන්දර අවස්ථා උපමා වශයෙන් යොදාගෙන ඇති අයුරු දැකිය හැකි ය. එකල බොහෝ රජවරුන්ට ස්වකීය උද්‍යාන පවා වෙන වෙන ම පැවැතී ඇත. එකල ස්වභාව ධර්මය හා මිනිසා අතර ඉතා සමීප සබඳතාවක් පැවති බව ද මෙමගින් අනාවරණය වෙයි. ශ්‍රාවකයන් වහන්සේලා තම දේශනාවන්හි දී සොබාදහම හා බැඳුණු උපමා බහුලව යොදා ගන්නට ඇත්තේ දන්නා දෙයින් නොදන්නා දෙයට සමීප කරවීමේ පහසුව නිසා විය යුතුය.

ලෝහ හා රත්‍රන් භාවිතය බුද්ධ කාලයේ දී බොහෝ දියුණුව පැවති බව ශ්‍රාවක භාෂිතයන්හි උපමා අධ්‍යයනයෙන් පැහැදිලි වෙයි. එසේ ම ඉතා සියුම් ගෘහ නිර්මාණ ශිල්පයක් ද වඩු කර්මාන්තයක් ද පැවති බව පෙනේ. මයිනහම, කණ්ණාඩිය, කියත, පසුම්බිය, ආභරණ, දඹරන් කාසි, නූල් බෝලය, ආයුධය. ආදී භාණ්ඩ එකල මෙන් ම වර්තමානයේ ද එම නම්වලින් හා ඊට සමාන නම්වලින් භාවිත වෙයි.

බෞද්ධ දර්ශනයට අනුව සත්‍ය වශයෙන් ම පවතින දේ 'පරමාර්ථ' යැයි කියනු ලැබේ. සත්‍ය වශයෙන් දැකිය නොහැකි දේ 'ප්‍රඥප්ති' ලෙස හඳුන්වයි.[24] ශ්‍රාවක භාෂිත දේශනාවන්හි දී සම්මුති හෙවත් ප්‍රඥප්ති පුද්ගලයාගේ අවයවයන් පිළිබඳ උපමාවන්හි දක්වෙයි. පඨවි, ආපො, තේජෝ, වායෝ නම් වූ මහා භූත රූපයන්ගෙන් සැදුම්ලත් ශරීරයෙහි ඇති නිසරු බව පැහැදිලි කිරීම සඳහාත් එයින් විඳින ආශ්වාදයෙහි නොවටිනාකම ඉස්මතු කර පෙන්වීම සඳහාත් උත්සාහ දරා ඇති බව අවබෝධ කරගත හැකි ය. විවිධ ශාරීරික ක්‍රියාකාරකම් පදනම් කොට ගත් අවස්ථාවන් ද උපමා රසයට එක්කොට ඇත. ශ්‍රාවකයා තම සිරුර පිළිබඳ දැඩි අවධිකමකින් සිටින නිසා එහි විවිධතාවන් උපමා කොට දැක්වීමෙන් ඇස් පනාපිට ම සත්‍යාසත්‍යතාව අවබෝධ කර ගැනීම පහසු ය.

සුවිශේෂී වශයෙන් යොදාගෙන ඇති උපමාවන් ද ශ්‍රාවක භාෂිත දේශනා තුළින් හමු වෙයි. තත්කාලීන සමාජයේ ව්‍යවහාරයේ පැවති යෙදුම් හෙවත් කියමන් ඒ සඳහා පාදක වූ බව සිතිය හැකි ය. 'පිය පුතු සෙනෙහස බඳු' 'කිරි දිය මෙන්' වැනි උපමාවන්ට අනුව එකල සමාජයෙහි පැවැති සමගි සම්පන්න බව එකමුතුකම පිළිබඳ යම් ඉඟියක් ලබාදෙයි. ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයෙකු ව වැඩ සිටි සමයක හා ඉන් පසුව සමස්ත පරිසරයෙහි පැවති සාමකාමී බව මෙමගින් අවධාරණය කර ඇත.

දියුණු සමාජ පසුතලයක දක්නට ලැබෙන වෙළඳාම, ගොවිතැන, ගව පාලනය මෙන් ම නුසුදුසු ව්‍යාපාර වන නිධන් හෑරීම හා සූදු කෙළිය ද යොදාගෙන ඇති උපමාවන් තුළින් පැහැදිලි වේ. එසේ ම 'අන්ධ' චරිතය බොහෝ විට උපමා කර තිබෙන්නේ අසරණ චරිතයක් ලෙස නොව නිරතුරුව රැවටෙන අනුවණ බව පසක් කිරීමට ය. වස මුසු පානයන් පිළිබඳ උපමා ද යොදාගෙන ඇති බැවින් සියදිවි හානිකර ගැනීමට යොදාගත් ක්‍රමෝපායයක් ද ඉස්මතු වන අතර ඖෂධීය පානයක ස්වරූපය දැක්වීමෙන් එකල රෝගයන්ට නිසි ප්‍රතිකාර ක්‍රමයන් ද පැවති බව අවබෝධ කරගත හැකි ය.

## සමෝධානය

ශ්‍රාවක භාෂිත දේශනා තුළ ඉතා පෞරාණික යුගයේ පටන් පැවත එන උපමා දැකිය හැකි ය. විශේෂයෙන් ගිහි සම්බන්ධ උපමා



එයට දැක්විය හැකි නිදසුනක් වෙයි. භාෂා භාවිතයේ දී උපමා භාවිතය ඉතා විශිෂ්ට ආකාරයෙන් මහා ශ්‍රාවකයන් වහන්සේලා කර ඇති අයුරු ඉහත කරුණුවලින් අවබෝධ කරගත හැකි ය.

## ආන්තික සටහන්

1. දීඝනිකාය II, පායාසිරාජඤ්ඤ සූත්‍රය, බු.ජ.මු. 2006, 526 පිටුව.
2. ම.නි. I, මහා වේදල්ල සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 1972, 694 පිටුව.
3. මජ්ඣිම නිකාය මූලපණ්ණාසකය, අණංගන සූත්‍රය, 63 පිටුව. ත්‍රිඃබුඃජඃමුඃ 2006.
4. එම, 68 පිටුව.
5. එම, 72 පිටුව.
6. එම, අනුමාන සූත්‍රය, 269 පිටුව.
7. එම, මධුපිණ්ඩික සූත්‍රය, 305 පිටුව.
8. එම, මහාගෝසිංග සූත්‍රය, 543 පිටුව.
9. එම, සන්දක සූත්‍රය, 343 පිටුව.
10. එම, 463 පිටුව.
11. එම, රට්ඨපාල සූත්‍රය, 449 පිටුව.
12. එම, ධනඤ්ජානි සූත්‍රය, 709 පිටුව.
13. එම, ධනඤ්ජානි සූත්‍රය, 709 පිටුව.
14. එම, ධනඤ්ජානි සූත්‍රය, 709 පිටුව.
15. එම, ධනඤ්ජානි සූත්‍රය, 709 පිටුව.
16. එම, උද්දෙස විභංග සූත්‍රය, 487 පිටුව.
17. එම, බක්කුල සූත්‍රය, 315 පිටුව.
18. එම, බහුවේදනීය සූත්‍රය, 117 පිටුව.
19. එම, නන්දකෝවාද සූත්‍රය, 577 පිටුව
20. එම.
21. එම, බාහීතික සූත්‍රය, 548 පිටුව.
22. එම, අනුරුද්ධ සූත්‍රය, 355 පිටුව.
23. එම, 465 පිටුව.
24. චන්දවිමල හිමි, රේරුකානේ. චතුරාර්ය සත්‍යය, ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය, 2010, 35 පිටුව.

25 MAY 2022
පුස්තකාලය